# කටපාඩම් පද - 4 ශ්‍රේණිය

## බයිබල් පාඨ

1) මොවුහු සමිඳුන්ගේ නාමයට ප්‍රශංසා කරත්වා! එතුමන්ගේ නාමය පමණක් උදාරතරය. එතුමන්ගේ මහිමය අහසත්, පොළොවත් ඉක්මවා යන්නේය. - **ගීතාවලිය** 148:13

2) පොළොව හා එහි ඇති සෑම දෙයද සකල ලෝවාසීහුද සමිඳුන් සන්තක වෙති. - **ගීතාවලිය** 24:1

3) ස්වාමිනි ඔබේ කර්මාන්ත කොපමණ විවිධාකාරද? ඔබ සියල්ල ප්‍රඥාවෙන් මැවූ සේක. පොළොව ඔබ මැවූ සතුන්ගෙන් පිරී ඇත. - **ගීතාවලිය** 104:24 4)

ජීවමාන සියල්ලෝ සමිඳුන් පසසත්වා! සමිඳුන්ට ප්‍රශංසා වේවා; - **ගීතාවලිය** 150:6

5) සමිඳුනි, අපේ සමිඳුනී, ඔබේ නාමය ලෝ පුරා කොතරම් මහිමාන්විත වන්නේද? ඔබේ තේජෝ මහිමය සගලොවින් එපිට පිළිරැව් දෙන්නේය. - **ගීතාවලිය** 8:1

6) මුළු පොළෝ වැසියෙනි, සමිඳුන් හට ප්‍රීති ඝෝෂා පවත්වන්න. - **ගීතාවලිය** 100:1

7) එතුමාණෝ සදහටම ඒවා පිහිටෙවූ සේක. ඒවාට ඉක්මවා ගිය නොහැකි සීමාවක් තැබූ සේක. - **ගීතාවලිය** 148:6

8) තරුණ තරුණියනි, මහල්ලන් හා බාලයෙනි, සමිඳුන් පසසන්න. - **ගීතාවලිය** 148:12

## අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය

9) අහස පොළොව මැවූ සියලු බලැති දෙවි පියාණන් වහන්සේ කෙරෙහි මම විශ්වාස කරමි - 1 **වගන්තිය**

10) ඔහුගේ එකම පුත්‍ර වූ අපගේ ස්වාමීන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ද මම විශ්වාස කරමි - 2 **වගන්තිය**